# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,147 — 1960 ජූනි 17 වැනි සිකුරාද — 17.6.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 117 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 120 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

### වේයන්ගොඩ සුළු නගර සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියමිත බල මණ්ඩලය විසින්, එනම්, වේයන්ගොඩ සුළු නගර සභාව විසින් සම්පාදිතව 1947 ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 වේ ජූනි මස 2 වැනි දින,
කොළඹදීය.

### නියෝග

1. ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද සතුන් මරන පොදු ස්ථානය සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරියාගේ භාරයේ තිබිය යුතුය. එකී සතුන් මරන ස්ථානයෙහි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ඒ නිලධාරියා විසින් වගකිය යුතුයි.

2. (1) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු—

(අ) ඒ සතා පරීක්ෂා කර බැලීම පිණිස සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරියා විසින් අවසර දෙන ලද නිලධාරියා විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම්; හෝ

(ආ) පූ. භා. 6 ටත් 10 ටත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි. එහෙත් කවර අවස්ථාවකදී වුවත්, මෙහි සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා ප්‍රධාන තුමා විසින් බලය දිය හැකිය.

(2) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72ක කාලයක් ගතවූවාට පසු කොයි යම් වේලාවක; හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමියෙන් හෝ සතුන් මැරීම සඳහා නියමකරණු ලැබූ කිසියම් ස්ථානයකදී පණ පිටින් ඉවත් කර ඇත්තේ නම්,

ඒ සතා නැවතත් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරණු ලැබීමට සුදුසුයයි (1) වැනි ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී නොමැරිය යුතුයි.

3. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පිළිවෙතක්ම යොදා ගතයුතුයි.

4. සතුන් මරන ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළයුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරියා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරියා විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකියි.

6. සතුන් මරන ස්ථානයේදී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියාගේ හෝ 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරියාගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත්, ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරන ස්ථානය භාරවූ නිලධාරියා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධි විධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියාගේ හෝ 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරියාගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත් වලත්, පස්සා ගාත්වලත් සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරියා විසින් "වේයන්ගොඩ සුළු නගර සභාව" යන මුද්‍රාව පිහිටුවා තිබේ නම්, මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. වෙනත් යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත්කර හෝ මුවාකර ස්ථාන ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. බෝවෙන රෝගයකින්, වසංගත රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන්නා වූ හෝ ළඟදී හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට සාත්තු කිරීමෙහි ළඟදී යෙදී සිටියාවූ හෝ කිසිම කෙනෙකුට එකී රෝගය බෝවීමට හෝ රෝග බීජයන් මෝරණු ලැබීමට ගතවන කාලසීමාවක් පසුවන තෙක් එකී සතුන් මරණ ස්ථානයට ඇතුල්වීමට හෝ කිසිම සතෙකු මැරීමේ කටයුතු වලට සහභාගි වීමට හෝ සතුන් මරණ කිසියම් ස්ථානයක් භාරව සිටින තැනැත්තා විසින් අවසර නොදිය යුතුය.

11. (1) සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් සුළු නගර සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභාවේ කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි:—

| | |
|---|---|
| හරකුන් සඳහා එකකුට | රුපියල් 1.00 |
| බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකට | ශත -.50 |

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසු මෙන් 2 වැනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙනවිට ඒ සතා, සතුන් මරණ ස්ථානයට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභාවේ කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම වුවමනා නොකෙරයි.

12. සතුන් මරන ස්ථානය භාර අයවිසින් සතුන් මරන ස්ථානයට ගෙන එන ලද සියළුම හරකුන් පිළිබඳ ලේඛනයක් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයේ පරිදි තබාගත යුතුයි:—

| හරක් කුවිතාන්සියේ නො. | වර්ගය | පාට | වයස | හංනිවරන | | මස් මරන්නාගේ නම | හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය. | පරීක්ෂාකර බැලූ දිනය | ගෙන ගිය දිනය | බැහැර කරණු | හරක් බාර ගත් ත සිලියම් තැනගේ සොම අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වමපැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

13. මේ නියෝගවල—

"සභාපතිතුමා" යනුවෙන් සුළු නගර සභාවේ සභාපතිතුමා අදහස් කරණු ලැබේ.

"සුළු නගර සභාව" යනුවෙන් වේයන්ගොඩ සුළු නගර සභාව අදහස් කරණු ලැබේ.

"සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරියා" යනුවෙන් ගම්පහ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරියා අදහස් කරණු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත (201 වැනි පරිච්ඡේදය) අදහස් කරණු ලැබේ.

---

## ගම්සභා ආඥාපනත — 198 වැනි පරිච්ඡේදය

### පනාවල් කෝරළේ ගම්කාර්‍ය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

ගම්කාර්‍ය සභා කාර්‍යාලයය,
පනාවල, 2.9.1959.

ඩී. සී. පෙරේරා,
ගම්කාර්‍ය සභාවේ සභාපති.

### යෝජනාව

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 31 වෙනි දින අංක 11,573 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවෙනි කාණ්ඩයේ ප්‍රසිද්ධකර වලංගුවට පමුණුවා ඇති මෙම පනාවල් කෝරළයේ ගම්කාර්‍ය සභාවේ යෝජනාව අනුව වර්ෂ 1953ක්වූ අප්‍රේල් මස 10 වෙනි දින දරණ අංක 10,517 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකර ඇති ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි ඡේදය අනුව මෙහි පහත සඳහන් කර ඇති පාරවල් සහ අඩිපාරවල්වල ඉදිරියෙන් සඳහන් කර ඇති නියම දිග හා පළලේ ප්‍රමාණය අනුව එකී පාරවල් සෑදීම හා ප්‍රතිසංස්කරණය කිරීම මෙම කාර්‍ය සභාව විසින් කරනු ලැබේ:—

| ඡන්ද කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ සහ අඩි පාරේ නම | දිග සැ. | දිග දම්. | පළල අඩි |
|---|---|---|---|---|
| 1. හිඟුරලකන්ද | 1. උඩයෝගම–මාතෘනිවාස පාර | 4 | — | 15 |
| | 2. සාප්පුවත්ත–රත්ඇල්ල පාර | 1 | — | 15 |
| | 3. දන්ගම්පල-හිඟුරලකන්ද පාර | — | 40 | 9 |
| | 4. උඩයෝගම–පඹේගම පාර | 2 | 40 | 15 |
| | 5. රත්ඇල්ල–නාහැල්ම පාර | 1 | — | 15 |
| | 6. ගොඩගම්පල–මාතෘනිවාස පාර | 1 | — | 9 |
| | 7. දන්ගම්පල–රූකාසල් පාර | 1 | 40 | 9 |
| | 8. මඩොල්පිටිය–මහහේන පාර | 1 | — | 9 |
| | 9. අටලහවල–රන්හවඩිකන්ද පාර | 1 | — | 9 |

| ඡන්ද කොට්ඨාශයේ නම සහ අංකය | | පාරේ සහ අඩිපාරේ නම | දිග සැ. | දිග දම්. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 2. ඉඹුල්පිටිය | 1. | ඉඹුල්පිටිය–පන්නිල පාර | 2 | — | 9 |
| | 2. | ඉඹුල්පිටිය–දිගෝව පාර | 2 | — | 9 |
| | 3. | මානික්කන්ද–දෙමැද පාර | 2 | 40 | 9 |
| | 4. | හුම්පිටිකන්ද–දෙමැද පාර | 2 | — | 9 |
| | 5. | ඉඹුල්පිටිය–මුරේකන්ද පාර | 1 | 40 | 9 |
| | 6. | ඉඹුල්පිටිය–හැමිංෆර්ඩ් පාර | 3 | 20 | 15 |
| | 7. | මුරුතවත්ත හැමිංෆර්ඩ් පාර | 1 | — | 9 |
| 3. ගොඩගම්පල | 1. | බැලුන්ගල–ඉඹුල්පිටිය පාර | 2 | — | 15 |
| | 2. | පල්ලේකන්ද–පන්නිල පාර | 1 | 20 | 9 |
| | 3. | අලවලගම–මහගම්මාසම පාර | 3 | 20 | 9 |
| | 4. | උඩගොඩගම්පල–පඹෙගම පාර | 1 | 20 | 15 |
| | 5. | කබරගල–පඹෙගම පාර | 1 | — | 9 |
| | 6. | හත්නාපිටිය–හැමිංෆර්ඩ් පාර | 1 | 40 | 9 |
| | 7. | ලෙනඉන්නේගම–තවුවලකන්ද පාර | 2 | 40 | 9 |
| | 8. | එලවුල්ල–බැවිල පාර | 3 | — | 9 |
| 4. පනාවල | 1. | පනාවල–බෝපැත්ත පාර | 1 | — | 9 |
| | 2. | පනාවල–අහුබුන්කඩුව පාර | 1 | 40 | 15 |
| | 3. | ගුරුගෙදරවත්ත–පනාවල පාර | 1 | — | 15 |
| | 4. | රංගේගම–බටන්ගල පාර | 1 | — | 9 |
| | 5. | රංගේගම–කම්බිඅඩිය පාර | 1 | 40 | 9 |
| | 6. | වුඩ්එන්ඩ්–රංගේගම පාර | 1 | — | 9 |
| 5. පූකුණුවල | 1. | පනාවල–අම්බලන්පිටිය පාර | 2 | 40 | 15 |
| | 2. | තලපිටිය–පඹෙගම පාර | 1 | — | 9 |
| | 3. | පූකුණුවල–අම්බලන්පිටිය පාර | 2 | 40 | 9 |
| | 4. | තලපිටිය–හුලන්ගස්දළුව පාර | 1 | — | 9 |
| | 5. | අම්බලමඕවිට–පූකුණුවල පාර | 1 | — | 9 |
| 6. බටන්ගල | 1. | තැළුම්පිටිය වෙලන්ගල්ල පාර | 1 | 20 | 15 |
| | 2. | මුරුත්තෙට්ටුව–මානියන්ගම පාර | 2 | — | 15 |
| | 3. | මුරුත්තෙට්ටුව–කන්දේවත්තේ පාර | — | 40 | 9 |
| | 4. | බටන්ගල–ගොරොක්ගස්වත්ත–ලක්මණ පාර | 2 | — | 9 |
| | 5. | ලක්මණ තැළුම්පිටිය පාර | 1 | — | 9 |
| 7. මානියන්ගම පහල | 1. | රිටිගහවෙල–ගලබලනකන්ද පාර | 2 | 40 | 15 |
| 8. මානියන්ගම ඉහල | 1. | මානියන්ගම–නාගොඩ පාර | 3 | 20 | 15 |
| | 2. | ස්මාල–ග්ලාසල් පාර | 1 | — | 9 |
| | 3. | බලුවැල්ල–මාදොල පාර | 1 | — | 9 |
| 9. මාදොල | 1. | මාදොල–වෙලන්ගල්ල පාර | 2 | — | 15 |
| | 2. | මාදොල-සීතාවක පාර | — | 60 | 9 |
| | 3. | මාදොල–මොරගහහේන් පාර | 1 | — | 9 |
| 10. මාහර | 1. | බිසෝදොල–මාහර පාර | 1 | 40 | 9 |
| | 2. | මාහින්ගොඩ තිබ්බොටුවාව පාර | — | 10 | 15 |
| | 3. | විලේගොඩ–අස්ගගුල පාර | 1 | — | 9 |
| | 4. | මාහර–ඉඹුලුංදෙනිය පාර | — | 60 | 9 |
| | 5. | තලගහමුල–හල්දොල පාර | 1 | — | 9 |
| | 6. | ඉහලගම–මාහර පාර | — | 40 | 9 |
| | 7. | තලපිටිය–හුලන්ගස්දළුව පාර | 1 | — | 9 |
| 11. පත්බේරිය | 1. | පරකඩුව-කොට්ටුන්න පාර | 1 | 40 | 15 |
| | 2. | පරකඩුව-පොත්දෙනිය පාර | 1 | 40 | 9 |
| | 3. | බැවිල–බෝමළුව පාර | — | 60 | 9 |
| 12. පරකඩුව | 1. | ගලහිටිය–මෙනේරිපිටිය පාර | 1 | 40 | 15 |
| | 2. | අළුපත–මෙනේරිපිටිය පාර | — | 60 | 9 |
| | 3. | තිරිවාන–මෙනේරිපිටිය පාර | — | 40 | 9 |
| | 4. | බෙන්දළුව–බෝමළුව පාර | — | 40 | 9 |
| | 5. | පත්බේරිය-බෝමළුව පාර | — | 40 | 15 |

# අතුරු ව්‍යවස්ථා

ආර්.ජී.ඩී.—ජීඊ 14.

**ගම්සභා ආඥාපනත**

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක-වග ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින්, සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශයෙන් සංශෝධිත එකී වගන්තියේ 2 වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,<br>
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ<br>
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර<br>
ලේකම් තැන.

1960 මැයි මස 24 වැනි දින,<br>
කොළඹ දීය.

**අතුරු ව්‍යවස්ථා**

## ආයුර්වේද බෙහෙත් ශාලා

**1.** ගම්සභා ආඥාපනතේ (198 වැනි ඡෙදය) 43 (බී බී) වැනි වගන්තිය යටතේ කාර්ය සභාව විසින් පටුම්පෙ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවත් හැර 1941කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නා වූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේ ය.

**2.** 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු විසින් හෝ කාර්ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව විසින් නියමකරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ යම් යම් පොත්පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්ය සභාව විසින් අනුමත කරණු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේ ය.

**3.** කාර්ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළහැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්ය සභාවේ වාර්ෂික අයවැය ලේඛණයෙන් හෝ වරින් වර කාර්ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ මුදල් වෙන් කළ යුතුද වන්නේ ය.

**4.** 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධි විධාන වලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම නොමිලයේ විය යුතුවාත් හැර, පාදුක්ක-වග ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමාවිය යුතුද වන්නේ ය.

**5.** ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධවල වටිනාකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් සත 50 බැගින් වූ ගාස්තුවක් කාර්ය සභාව විසින් අය කළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියෙකුගෙන් අයකරණු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළයුතු වන්නේ ය. එකී සෑම කුවිතාන්සිය කම කාබන් අනුපිටපතක් තිබියයුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේ ය.

**6.** සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළ හැකි වන්නේ ය.

**7.** ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා හිතවතුන්ගෙන් ලැබෙන යම් යම් පරිත්‍යාග මුදල් එකී බෙහෙත් ශාලාවේ වියහියදම් පියවා ගැනීම පිණිස ප්‍රයෝජනයට ගතයුතු වන්නේ ය.

**8.** සභාපතිතුමා විසින් දෙසැම්බර් මාසයේ 31 වැනි දයින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල්ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැළැස්විය යුතු වන්නේ ය.

**9.** මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරණු ලැබේ.

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරණු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක-වග ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරණු ලැබේ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.